# මහනුවර මහා නගර සභාවේ මුල් ළමාවිය සංවර්ධන උපකාරක නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම් - 2023

1987 අංක 19 දරන මහා නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරය) 40(1) වගන්තිය යටතේ මුල් ළමාවිය සංවර්ධන උපකාරක නිලධාරි තනතුර සඳහා මහනුවර මහා නගර සභා බල ප්‍රදේශයේ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය (කොන්ත්‍රාත් පදනම මත) :

1.1 බඳවා ගැනීමේ පොදු කොන්දේසි :

1.1.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

1.1.2 අයදුම්කරුවන් මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි කාන්තා අයදුම්කරුවන් විය යුතුය. (අයදුම්කරුවන්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනක (03ක) කාලයක් මෙම මහා නර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු බවට සනාථ කෙරෙන ලියවිලි සම්මුඛ පරීක්ෂණයේ දී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය.)

1.1.3 අයදුම්කරුවන්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු හා වයස අවු. 30 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයන් හට මෙම තනතුරු සඳහා ඉල්ලුම් කළ නොහැක.

1.1.4 අයදුම්කරුවන්, විශිෂ්ඨ චරිතයකින් හා මසා සෞඛ්‍ය තත්වයකින් සිටිය යුතුය.

1.1.5 සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

1.1.6 අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

1.2 *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1.2.1 මෙම තනතුර මහනුවර මහා නගර සභාවේ ගරු මහා සභා අනුමැතිය මත සේවා අවශ්‍යතාවය සලකා පිහිටුවා ගනු ලබන තනතුරක් වන අතර මහා නගර සභා ආඥාපනතේ (40) 1, (ආ), (ආ), (ඇ) (ඇ) යන විධිවිධානයන්ට යටත් වේ. මෙම තනතුර විශ්‍රාම වැටුප් රහිතය. ගරු මහා සභාව විසින් හෝ නාගරික කොමසාරිස්වරයා විසින් සේවා අවශ්‍යතාවය මත තීර්ණය කරනු ලබන කාල සීමාවන් සඳහා සේවයේ නියුක්ත කරවනු ලබයි. එසේම මෙම තනතුරු සම්බන්ධව ගරු මහා සභාව හෝ නාගරික කොමසාරිස්වරයා ඉදිරියේ දී ගනු ලැබිය හැකි තීරණයන්ට මෙහි සඳහන් කරුණු යටත් වේ.

1.2.2 මාසික දීමනාව : මුල් ළමාවිය සංවර්ධන උපකාරක නිලධාරි තනතුර සඳහා හිමි මාසික දීමනාව රු. 27,000.00 කි.

2. තනතුර හා අධ්‍යාපන සුදුසුකම් :

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *බඳවා ගැනීමට අපේක්ෂිත උපරිම තනතුරු ගණන* | *වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* | *අධ්‍යාපන සුදුසුකම්* | *රාජකාරී ස්වභාවය* |
|---|---|---|---|---|---|
| 01 | මුල් ළමාවිය සංවර්ධන උපකාරක නිලධාරි | 10 | 01. පූර්ව පාඨශාලා අධ්‍යාපනය පිළිබඳ විවෘත විශ්ව විද්‍යාලයේ බාහිර සේවා මණ්ඩලය මගින් නිකුත් කරන පූර්ව පාසැල් අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව හෝ | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සා. පෙළ විභාගයේ දී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය හා තවත් විෂයයන් (2) දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එක්වර විෂයයන් 06කින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත් වී තිබීම හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක් වත් සමත් වී තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | පෙර පාසල් දරුවන් සාමාජානුයෝජනගත කිරීම, දරුවන්ගේ පෞරුෂය වර්ධනය, දැනුම, කුසලතා ආකල්ප වලින් පිරිපුන් දරුවන් බවට පත් කර නිර්මාණශීලී දරුවන් බිහිකිරීම සඳහා මූලික පදනම සැකසීම |

| අනු. අංකය | තනතුරු නාමය | බඳවා ගැනීමට අපේක්ෂිත උපරිම තනතුරු ගණන | වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | අධ්‍යාපන සුදුසුකම් | රාජකාරී ස්වභාවය |
|---|---|---|---|---|---|
| | | | 02. ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ළමා ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි කර ඇති ආයතන මගින් පිරිනමනු ලබන පෙර පාසැල් ගුරු පුහුණු ඩිප්ලෝමාව හෝ<br><br>03. මධ්‍යම පළාත් සභාවේ මුල් ළමා විය සංවර්ධන ඒකකය මගින් පිරිනමනු ලබන පෙර පාසැල් ගුරු පුහුණු ඩිප්ලෝමාව හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමත අයතන මගින් පිරිනමනු ලබන පෙර පාසැල් ගුරු පුහුණු ඩිප්ලෝමාව ලබා තිබීම.<br><br>*මෙම ඩිප්ලෝමා පාඨමාලාවේ කාල සීමාව අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩි විය යුතුය. තවද ඉංග්‍රීසි මාධ්‍ය ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම විශේෂ සුදුසුකමකි | * එම විභාගයන්හි දී චිත්‍රකර්මය, සංගීතය හා නැටුම් යන සෞන්දර්ය විෂයයන්ගෙන් සමත්වීම විශේෂ සුදුසුකමක් වනු ඇත. | |

** ඉහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමේ දී මහනුවර මහා නගර සභාවේ පවතින සේවා අවශ්‍යතාවය සළකා ඒ අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

03. බඳවා ගැනීමේ ක්‍රමය : 100% විවෘත පදනම මත

- ඉදිරිපත් කර ඇති අයදුම්පත් අතුරින් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කර ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී පහත අංශ කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

| පරීක්ෂාකර ලකුණු ලබාදෙන ශීර්ෂ | | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | උපරිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරා ගනු ලැබේ. |
| 02 | වෘත්තීය පළපුරුද්ද (එක් අවුරුද්දක පළපුරුද්ද සඳහා ලකුණු 5 බැගින් උපරිම අවු. 05 ක් සඳහා) | 25 | |
| 03 | මහනුවර මහා නගර සභාවට අයත් පෙර පාසැලක පුහුණුව ලබා තිබීම | 10 | |
| 04 | නර්තනය, ගායනය, වාදනය චිත්‍ර කලාව හා නිර්මාණශීලිත්වය (අත්කම් නිර්මාණ) ආදී විෂයයන් අතුරින් විෂයයන් 02 ක් සම්බන්ධව සිදු කරනු ලබන ප්‍රායෝගික ඉදිරිපත් කිරීම් (කාලය විනාඩි 05යි) | 35 | |
| | මුළු ලකුණු | 100 | |

04. අයදුම් කළයුතු ආකාරය ፡

4.1 මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි (A4) 12 x 8'27 ප්‍රමාණයේ පිටුවල දෙපසම භාවිතා කරමින් අයදුම්පතක් සකස් කර **2023 ජනවාරි මස 15 දිනට** හෝ ඊට පෙර නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4.2 ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ අයදුම්කරන තනතුර අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

4.3 නියමිත දිනට නොලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.4 අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය.

01. උප්පැන්න සහතිකය
02. අධ්‍යාපන සහතිකය
03. පදිංචිය සනාථ කිරීමේ ග්‍රාම නිලධාරී විසින් මාස තුනක කාලයක් තුළ නිකුත් කරන ලද සහතිකය
04. මෑතකදී ලබාගත් චරිත සහතිකය
05. වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
06. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත

(මුල් පිටපත සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු බැවින් මුල් පිටපත් එවීමෙන් වළකින ලෙස කාරුණිකව දන්වමි.)

කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක,
මහනුවර නාගරික කොමසාරිස්,

2022 දෙසැම්බර් මස 22 වැනි දින,
මහනුවර මහා නගර සභාවේ දී ය.